BRIDGE to EQUALITY

සමානාත්මතාවය සොයා...
சமத்துவத்தை தேடுதல்...

# ශ්‍රී ලංකාවේ SOGIE වලට බලපාන නීති සහ ප්‍රතිපත්ති



# හැඳින්වීම

BRIDGE to Equality ව්‍යාපෘතිය විසින් මෙම පොත් පිංච ශ්‍රී ලංකාවේ LGBTI ප්‍රජාව සඳහා සම්පතක් ලෙස ඉදිරිපත් කරයි. මෙම පොත් පිංච ප්‍රජා නායකයින් ගණනාවක් සමඟ පවත්වන ලද ප්‍රජා උපදේශනයකින් පසුව ඔවුන් බෙදා ගන්නා ලද අත්දැකීම් සහ නීතිමය ලියවිල්ලකින් සම්පූර්ණ විය යුතු අපේක්ෂාවන් හඳුනා ගෙන ඒවා පාදක කර ගනිමින් ප්‍රජාව වෙනුවෙන්ම සකස් කරන ලද ලේඛනයකි.



# අන්තර්ගතය


- නීතිය: අයාලකම
- නීතිය: ලිංගික වෘත්තිය
- මූලික අයිතිවාසිකම්
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනිම සඳහා වූ සහතිකය
- ශ්‍රී ලංකා පොලිසිය
- සහන ලබා ගත හැකි ආයතන
- හදිසි සම්බන්ධතා




# නීතිය: අයාලකම

## 1841 අංක 04 දරන පාදඩ (අයාල) ආඥා පනත

3 වන වගන්තිය: නිකරුණේ ගැවසෙන සහ අශෝභන ලෙසෙ හැසිරෙනවා යැයි සැලකෙන පුද්ගලයන්

ඔබ ප්‍රසිද්ධියේ ආක්‍රමණශීලී සහ නොසන්සුන්කාරී ලෙස හැසිරෙන්නේ නම්.

උදාහරණ:

ඔබ අරමුණක් නොමැතිව ප්‍රසිද්ධියේ ඉබාගාතේ හෝ නිකරුණේ සිටින බව පෙනී ගියහොත්

**3 වන වගන්තිය. නිකරුණේ ගැවසෙන පුද්ගලයන් ලෙස සැලකෙන පුද්ගලයන්.**

ඔබ යැපීම් මාර්ගයක් සලසා ගැනීමට හැකි නිරෝගී පුද්ගලයෙකු වුවද;

ප්‍රසිද්ධියේ,

- තමන්ව නඩත්තු කිරීම හිතාමතාම ප්‍රතික්ෂේප කිරීම
- ආක්‍රමණශීලී හෝ නොහික්මුණු ලෙස හැසිරීම
- අරමුණක් නොමැතිව ඉබාගාතේ යාම සහ නිකරුණේ සිටීම
- ඕනෑම නිවසක/ගොඩනැගිල්ලක හෝ දැන්වීමක පැත්තක් විකෘති කිරීම

එවන් අවස්ථාවලදී ඔබ 'නිකරුණේ ගැවසෙන සහ අශෝභන ලෙසෙ හැසිරෙන පුද්ගලයෙකු' ලෙස සැලකේ. එවැනි අවස්ථාවකදී පොලිස් නිලධාරියෙකුට වරෙන්තුවක් නොමැතිව ඔබව අත්අඩංගුවට ගත හැකිය.

**7 වන වගන්තිය:** 'අවකල් ක්‍රියාවන්හි යෙදීම හෝ ඊට පෙළඹවීම' , 'දරුණු අශෝභන ක්‍රියා' සහ 'ප්‍රසිද්ධ ස්ථාන වල නිකරුනේ ගැවසීම'

**7 වන වගන්තිය. පොදු ස්ථානවල අවකල් ක්‍රියාවන්හි යෙදීම හෝ ඊට පෙළඹවීම සහ අශෝභන ලෙස හැසිරීම.**

ඔබ,

- නීති විරෝධී ලිංගික ක්‍රියාකාරකම්
- අවිනීත ක්‍රියාකාරකම්
- නියමිත නීතිවලට පටහැනිව හෝ අවසරයකින් තොරව පොදු ස්ථානයක, හෝ
- ඔබ එහි සිටීමට පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් කළ නොහැකි පුද්ගලික ස්ථානයක

ඉහත දැක්වෙන ක්‍රියාවල නිරත වන්නේ හෝ එම ක්‍රියාවන් ප්‍රවර්ධනය කරන්නේ නම්;

ඔබ දඬුවම් ලැබිය හැකි වරදකට වැරදිකරු වන අතර, පොලිසියට වරෙන්තුවක් නොමැතිව ඔබව අත්අඩංගුවට ගත හැකිය.

# නීතිය: ලිංගික වෘත්තිය

ලිංගික වෘත්තිය ශ්‍රී ලංකාවේ නීතියට අනුව අපරාධයක් නොවේ.

පාදඩ ආඥාපනතේ 7 වැනි වගන්තියට අනුව ප්‍රසිද්ධියේ ඉල්ලීම් කිරීම සහ අවකල් ක්‍රියාවන් වලට පෙලඹවීම වරදකි.

ගණිකා නිවාසයේ ආඥාපනතට අනුව ගණිකා නිවාසයක් පවත්වාගෙන යාම තහනම් කර ඇත.

## 1889 අංක 5 දරන ගණිකා නිවාස ආඥාපනත

ගණිකා නිවාස ආඥා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ඔබ,

- ගණිකා නිවාසයක් පවත්වාගෙන යාම, කළමනාකරණය කිරීම, හෝ ඒ සඳහා සහාය දෙන්නේ නම්
- ගණිකා වෘත්තිය සඳහා යොදා ගන්නා බව දන්නා ස්ථානයක ජීවත් වන්නේ නම්
- ගණිකා මඩමක් ලෙස ඔබ දන්නා ස්ථානයක යම් අයිතියක් තිබේ නම්

නීතිය ඉදිරියේ වැරදිකරුවෙකි.

ගණිකා නිවාසයක් ලෙස අර්ථ දැක්වෙන්නේ පිරිමින් නැවත නැවතත් කාන්තාවන් සමඟ ලිංගිකව එක් වීමට පැමිණෙන ස්ථානයකි.

## දණ්ඩ නීති සංග්‍රහය 360 අ වගන්තිය

උපවගන්තිය 1 : ගණිකාවක් වීමට පුද්ගලයෙකු බඳවා ගැනීම අපරාධයකි.

**උපවගන්තිය (1)**

**ඔබ ගණිකාවක් වීමට ඕනෑම වයසක පිරිමියෙකු හෝ කාන්තාවක් බඳවා ගැනීමට හෝ බඳවා ගැනීමට උත්සාහ කරන්නේ නම්.**

## පාදඩ ආඥාපනත

9 වැනි වගන්තිය: ගණිකා වෘත්තියෙන් වෙනත් කෙනෙකු ලබන ඉපැයීම්වලින් පුද්ගලයෙකු ජීවත් වන්නේ නම් එය අපරාධයකි.

**9 (1)(අ) වගන්තිය: ඔබ දැනුවත්ව වෙනත් පුද්ගලයෙකු ගණිකා වෘත්තියෙන් ලබන ඉපැයීමෙන් ජීවත් වන්නේ නම් එය වරදකි.**

සටහන: උපත් පාලන කොපු (කොන්ඩම්) රැගෙන යාම.

උපත් පාලන කොපු රැගෙන යාම හෝ තමා තමා සන්තකයේ තබා ගැනීම පාදඩ ආඥාපනත යටතේ වරදක් නොවේ. උපත් පාලන කොපුවක් යනු වෛද්‍ය උපාංගයක් වන අතර එය ගණිකා වෘත්තියෙහි යෙදුනු බවට ඔප්පු කිරීමට සාක්ෂියක් ලෙස භාවිතා කළ නොහැක.



# මූලික අයිතිවාසිකම්

(අ) සෑම පුද්ගලයෙකුටම හිමි වන අයිතිවාසිකම්ඃ ව්‍යවස්ථාවන්;

- 10. සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස
- 11. වධ හිංසා වලින් නිදහස හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට හෝ දඬුවම් වලට යටත් වීමෙන් නිදහස
- 12. සර්ව සාදාරණත්වයේ අයිතිය- නීතිය ඉදිරියේ සමානාත්මතාවයට ඇති අයිතිය සහ නීතියේ සමාන ආරක්ෂාව ලැබීමට ඇති අයිතිය
- ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත වෙනස්කම් වලට භාජනය නොවීමට ඇති අයිතිය
- 13. අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස;
- නීතියෙන් නියම කරන ලද කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම පුද්ගලයෙකු සිරභාරයට නොගැනීමට ඇති අයිතිය සහ සිරභාරයට ගන්නේ නම් එසේ ගැනීමට හේතුව දැන ගැනීමට ඇති අයිතිය
- නීතියෙන් නියම කර ඇති කාලයට වඩා වැඩි කාලයක් අධිකරණ නියෝගයකින් තොරව අත්අඩංගුවේ තබා නොගැනීමේ අයිතිය
- වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින තැනැත්තකුට නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයකදී පෞද්ගලිකව හෝ නීතිඥවරයකු මාර්ගයෙන් කරුණු කියා සිටීමට ඇති අයිතිය
- නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරන ලද නියෝගයකින් මිස මරණීය දණ්ඩනයට හෝ සිරගත නොකිරීමට ඇති අයිතිය
- වරදකරු බව ඔප්පු වන තුරු නිර්දෝෂී යැයි සැලකීමේ අයිතිය
- යම් ක්‍රියාවක් සිදු කල හෝ සිදු කිරීමෙන් වැලකුනු අවස්ථාවෙදී එම ක්‍රියාව නීතියට අනුව වරදක් නොවේ නම් පසුව එය වරදක් වූ පසු ඒ සඳහා දඬුවම් නොකිරීමට ඇති අයිතිය
- 14. භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ, රැකියාවේ සහ යාම් ඊම් සඳහා ඇති නිදහස
- භාෂණයේ සහ ප්‍රකාශනය ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස
- සාමකාමීව රැස් වීමට ඇති නිදහස
- සමාගමයේ නිදහස
- වෘත්තීය සමිති පිහිටුවීමට හා වෘත්තීය සමිති සමඟ සම්බන්ධ වීමට ඇති නිදහස
- තනිවම හෝ අන් අය සමග තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමේ සහ ඉගැන්වීමෙන් තම ආගම ප්‍රකාශ කිරීමේ නිදහස
- තමා විසින්ම හෝ අන් අය සමඟ ඇසුරු කරමින් තම සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමට, භුක්ති විඳීමට සහ තම භාෂාව භාවිතා කිරීමට ඇති නිදහස
- ඕනෑම නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, වෙළඳාමක, කාර්මාන්තයක, ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියැලීමේ නිදහස
- ශ්‍රී ලංකාව තුළ ගමන් කිරීමේ නිදහස සහ තම පදිංචිය තෝරා ගැනීමේ නිදහස
- නැවත ශ්‍රී ලංකාවට පැමිණීමේ නිදහස

## මූලික අයිතිවාසිකම් වෙත පනවා ඇති සීමා

15 වෙනි ව්‍යවස්ථාවේ පහත දැක්වෙන හේතූන් මත මූලික අයිතිවාසිකම් වෙත සීමා පැනවිය හැකි බව දක්වා ඇත.

- මහජන ආරක්ෂාව වෙනුවෙන් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා
- වාර්ගික සහ ආගමික සහයෝගීතාවය තහවුරු කිරීම සඳහා
- පාර්ලිමේන්තු වරප්‍රසාද තහවුරු කිරීම සඳහා
- අධිකරණයට අපහාස කිරීම, හෝ වරදක් සඳහා පෙළඹවීම වැළක්වීම සඳහා
- ජාතික ආර්ථිකයෙහි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා
- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුබසාධනය සඳහා සහ මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම සඳහා.

## 17 වන ව්‍යවස්ථාව. මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීමට ගත හැකි ප්‍රතිකර්ම

සෑම පුද්ගලයෙකුටම කිසියම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් හේතුවෙන් තම මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වී හෝ උල්ලංඝනය වීමට ආසන්නව ඇත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට හිමිකම් ඇත.

## 126 වන ව්‍යවස්ථාව. මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය සහ එම බලය ක්‍රියාත්මක කිරීම

ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳව විභාග කිරීමේ සහ තීරණය කිරීමේ අධිකරණ බලය හිමි ව ඇත.

උල්ලංඝනය සිදු වී මාසයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් ගොනු කළ යුතුය.

මෙම මාසයක කාල සීමාව මත පරිබාධකයට ඉඩ ලබා දෙන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිල්ල ඔබට යොමු කළ හැකිය.

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතිකය

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් "සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීම සඳහා වූ සහතිකය නිකුත් කිරීම" පිළිබඳ 2016.06.16 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංකඃ 01-34/2016;

- උප්පැන්න සහතිකයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කිරීමේ ක්‍රියාවලියට සහාය වීම සඳහා විශේෂඥ මනෝ වෛද්‍යවරයෙකු විසින් මෙම සහතිකය (GRC) නිකුත් කිරීමට නියමිතය.
- අවුරුදු 16ට වැඩි අයට පමණක් සහතිකය නිකුත් කරනු ලබයි.
- එය උප්පැන්න සහතිකයේ දැක්වීමට අපේක්ෂිත ස්ත්‍රී පුරුෂ සමාජභාවය දක්වයි.
- විශේෂඥ මනෝ වෛද්‍යවරයා සහ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රෝහලක ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ඇත.
- උප්පැන්න සහතිකයේ සංශෝධනයෙන් පසුව පුද්ගලයන්ට ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය, රියදුරු බලපත්‍රය සහ අධ්‍යාපන සහතික ආදිය සඳහා අයදුම් කිරීමට හැකියාව ඇත.

**චක්‍ර ලේඛනයඃ**

ඉංග්‍රීසිඃ
http://www.health.gov.lk/CMS/cmsmoh1/viewcircular.php?cno=01-34/2016&med=english

දමිළඃ
http://www.health.gov.lk/CMS/cmsmoh1/viewcircular.php?cno=01-34/2016&med=tamil

සිංහලඃ
http://www.health.gov.lk/CMS/cmsmoh1/viewcircular.php?cno=01-34/2016&med=sinhala

# ශ්‍රී ලංකා පොලිසිය

## අපරාධයක් සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම

ඔබගේ ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හා ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (SOGIESC) කුමක් වුවත් ශ්‍රී ලංකා පොලිසියේ පැමිණිල්ලක් කිරීමට ඔබට අයිතියක් ඇත.

**ප්‍රඃ පැමිණිල්ල ඉදිරිපත් කළ යුතු ස්ථානය කුමක්ද?**

සාමාන්‍යයෙන් පැමිණිල්ලක් කළ යුත්තේ අපරාධය සිදු වූ ස්ථානය ආසන්නයේ ය.

**ප්‍රඃ ඔබ පැමිණිල්ල කළ යුත්තේ කවදාද?**

අපරාධය සිදු වූ වහාම පැමිණිල්ල ඉදිරිපත් කළ යුතුය.

**ප්‍රඃ පොලිස් ස්ථානයේදී ඔබ කුමක් කළ යුතුද?**

පොලිස් ස්ථානාධිපති සමඟ කතා කරන්න. ඔවුන් පැමිණිල්ල කළ යුතු අදාළ අංශය වෙත ඔබව යොමු කරනු ඇත. පැමිණිල්ලක් කිරීමට ඔබේ ඉල්ලීම ඔවුන්ට ප්‍රතික්ෂේප කළ නොහැක.

(උදාඃ එය සොරකම් කිරීමක් පිළිබඳ පැමිණිල්ලක් නම්, එවිට ඔබව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ඇත.)

**ප්‍රඃ ඔවුන් පැමිණිල්ල භාර ගැනීම ප්‍රතික්ෂේප කළොත්?**

සහකාර පොලිස් අධිකාරී (ASP) සමඟ කතා කිරීමට ඉල්ලා සිටින්න.

ඔවුන් ඔබේ මූලික අයිතිවාසිකම් කඩ කරන බව පොලිසියට දන්වන්න.

**ප්‍රඃ පැමිණිල්ල ඉදිරිපත් කිරීමේදී ඔබ සැපයිය යුතු තොරතුරු මොනවාද?**

- ඔබව හඳුන්වා දෙන්න (සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, වයස, රැකියාව, පදිංචිය, සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර)
- සිද්ධිය වූ වේලාව, දිනය, ස්ථානය
- චූදිතයන් විස්තර කරන්න (ඔබ සතුව ඇති සියලුම විස්තර දන්වා සිටින්න, වඩාත් ගැලපෙන නම, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, රැකියාව/තනතුර)
- චෝදනාව විස්තර කරන්න (උදා. ලිංගික හිරිහැර, කුමන ආකාරයේ හිරිහැරයක්ද, ඔබට එසේ සිතීමට ඔවුන් කළේ කුමක්ද)
- ඔබ සොයන පිළිසරණ කුමක්ද කියා සිටින්න. (උසාවියට යාමට, සමතයට පත් කර ගැනීමට, වන්දි ඉල්ලා සිටීමට යන ආකරයෙන්)

**ප්‍රඃ පැමිණිල්ල කළ පසු අපේක්ෂා කළ යුත්තේ කුමක්ද?**

ඔබේ පැමිණිල්ල සම්බන්ධයෙන් පසු විපරම් කරන ආකාරය පිළිබඳව පොලිස් නිලධාරියා ඔබට උපදෙස් දිය යුතුය.

ජාතික හැඳුනුම්පතක්, බලපත්‍රයක් ආදිය අස්ථානගත වූ විට ඔබේ පැමිණිල්ලේ පිටපතක් සඳහා ඔබට හිමිකම් ඇත.

පසුකාලීන නඩු විභාගයේ දිනකදී එය අසත්‍ය සාක්ෂි ලෙස භාවිතා කළ හැකි නම් ඔබට පැමිණිල්ලේ පිටපතක් නිකුත් නොකෙරේ.

ඔබ වූදිතයා නම්, පැමිණිල්ලේ පිටපතක් සඳහා ඔබට හිමිකම් ඇත.

**ප්‍රඃ ශ්‍රී ලංකා පොලීසිය විසින් සිදු කරන ලද වැරද්දකට එරෙහිව සිදු කළ යුත්තේ කුමක්ද?**

ශ්‍රී ලංකා පොලිසියේ ක්‍රියා සම්බන්ධයෙන් පැමිණිල්ලක් කිරීමට ඔබට අවශ්‍ය නම්;

- මහජන පැමිණිලි විමර්ශන අංශය (PCID) හෝ ජාතික පොලිස් කොමිෂන් සභාවේ ඕනෑම පළාත් කාර්යාලයකට පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න.
- පළාත් කාර්යාලයට ලැබෙන මහජන පැමිණිලි පිළිබඳ විමර්ශන භාරව කටයුතු කිරීමට සෑම පළාතක් සඳහාම පළාත් අධ්‍යක්ෂවරයකු පත් කළ යුතුය. ඔහු කොමිසමේ අධ්‍යක්ෂ, PCID වෙත කෙලින්ම වාර්තා කළ යුතුය.
- පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් සේවයට එරෙහිව ලැබෙන ඕනෑම මහජන පැමිණිල්ලක් සතියක් ඇතුළත බලයලත් නිලධාරියෙකු විසින් පිළිගත යුතුය.

සටහනඃ පැමිණිල්ලක් කිරීමට පොලිස් ස්ථානයට යන විට, ඔබ නීති උපදේශකවරයෙකු හෝ නීතිඥවරයෙකු සමග යෑම සුදුසුය.

**සටහනඃ**

## ලිංගික හිංසනය පිළිබඳ පැමිණිලි කිරීම

DNA සාක්ෂි විනාශ නොකර වහාම පොලිසියට යාම සුදුසුය.

ඔබ මුලින්ම රෝහලකට යන්නේ නම්, ඔබ පොලිසියට පැමිණිල්ලක් කිරීමට අදහස් කරන බව ඔවුන්ට දන්වන්න.

පොලිස් කොට්ඨාශ සාක්ෂි එකතුවට වෛද්‍ය පරීක්ෂණ, ඇඟිලි සලකුණු, DNA පරීක්ෂණ ආදිය ඇතුළත් වේ.

## අත් අඩංගුවට ගැනීමකදී හෝ රඳවා තබා ගැනීමකදී ඔබට හිමිවන අයිතිවාසිකම්

13 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව අත්අඩංගුවට ගනු ලැබූවද ඔබට මූලික අයිතිවාසිකම් හිමි වේ.

ඔබගේ SOGIESC කුමක් වුවත් පොලිසිය අත්අඩංගුවට ගැනීමේදී පහත පියවර අනුගමනය කළ යුතුය.

- අත්අඩංගුවට ගැනීමට හේතුව ඔබට දැන්විය යුතුය.
- අත්අඩංගුවට ගන්නා නිලධාරියා නිල ඇඳුමින් නොසිටින්නේ නම්, ඔවුන්ගේ නම, තනතුර, අංකය සහ පොලිස් ස්ථානය සඳහන් කිරීමෙන් ඔවුන් හඳුනාගත යුතුය.
- අත්අඩංගුවේ පසුවන සෑම පුද්ගලයෙකුම, ළඟම ඇති නිසි අධිකරණයේ විනිසුරුවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.
- වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගතහොත්, පොලිසියට ඔබව රඳවා තබා ගත හැක්කේ ඔබ විනිසුරුවරයෙකු වෙත ඉදිරිපත් කරන තෙක් පැය 24ක් පමණි.

සටහන: පොලීසිය විසින් කරන සෙවීමකදී සෙවීමට හේතුව සහ සාධාරණ සැකයට හේතුව පොලිසිය ඔබට දැනුම් දිය යුතුය.

- අත්අඩංගුවට ගැනීමේදී ඔබ කාන්තාවක් නම් කාන්තා පොලිස් නිලධාරිනියක් සිටිය යුතුය.
- ඔබව සෙවීම සඳහා පොලිස් ස්ථානයට ගෙන යන ලෙස ඉල්ලා සිටිය හැක. සෙවීමකට ඉදිරිපත් කිරීම සඳහා ඔබව පොලිස් ස්ථානයට ගෙන යන ලෙස ඉල්ලීමට හිමිකම් ඇත.

අත්අඩංගුවට ගත් පසු, අත්අඩංගුවට ගත් පුද්ගලයාගේ හඳුනන අය, මිතුරෙකු, පවුලේ අය හෝ නීතිඥයෙකුට ඔවුන් අත්අඩංගුවට ගැනීම ගැන දැනුම් දීම පොලිස් නිලධාරියාගේ යුතුකමක් වේ.

ඔබ අත්අඩංගුවේ තබා ඇත්නම්, ඔබට අවශ්‍ය ඇඳුම්, ජලය සහ ආහාර වැනි මූලික අවශ්‍ය ද්‍රව්‍ය ඔබ වෙත ගෙන එන ලෙස ඉල්ලා සිටිය හැකිය.

# සහන ලබා ගත හැකි ආයතන

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ ආරක්ෂා කිරීමේ පනත

(අංක.428/11 ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල)

අපරාධවල වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැපයීම.

උදාහරණයඃ ඔබ හඳුනාගැනීමේ පෙරට්ටුවකට සහභාගී වන අයෙකු නම් ඔබේ ආරක්ෂාව ගැන බියෙන් පියවරක් පසුපසට ගන්නා අවස්ථාවකදී ඔබට ආරක්ෂාව සැපයීම.

## 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් අත්විඳින හෝ අත්විඳීමට ඉඩ ඇති පුද්ගලයෙකුට ආරක්ෂණ නියෝගයක් සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට අයදුම් කළ හැකිය.

දවස් 14 දක්වා වලංගු වන අතුරු ආරක්ෂණ නියෝගයක් මහේස්ත්‍රාත් අධිකරණයට නිකුත් කළ හැකිය.

අධිකරණයට මාස 12 ක් සඳහා වලංගු ආරක්ෂණ නියෝගයක් නිකුත් කළ හැකිය.

එය ප්‍රචණ්ඩත්වයෙන් පෙළෙන පුද්ගලයාගේ ආරක්ෂාව සඳහා නිකුත් කරයි.

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත ස්ත්‍රී පුරුෂ භාවය සඳහා මධ්‍යස්ථ පාරිභාෂිත භාවිතා කරයි, එබැවින්, SOGIESC තත්වය නොතකා ඕනෑම පුද්ගලයෙකුට තම 'කලත්‍රයා', 'වෙන් වීමට පෙර සිටි කලත්‍රයා' හෝ 'සංවාසයේ යෙදෙන සහකරු' ගෙන් ආරක්ෂාව පතා අයදුම්පතක් ගොනු කළ හැකිය.

මෙම පනත යටතේ ශාරීරික හිංසනය සහ චිත්තවේගීය හිංසනය යන දෙකම 'ගෘහස්ථ හිංසනය' ලෙස හඳුන්වා දී ඇත.

# හදිසි සම්බන්ධතා

## රාජ්‍ය උපකාරක මාර්ග

### ශ්‍රී ලංකා පොලීසිය

හදිසි ඇමතුම් අංක: 118/119

පොලිස් හදිසි ඇමතුම්: 011-2433333

පොලිස් හදිසි ජංගම ප්‍රතිචාර අංශය: 011-5717171

### ජාතික පොලිස් කොමිෂන් සභාව:

ජාතික පොලිස් කොමිෂන් සභාව, BMICH පරිශ්‍රය, අංක 09 ගොඩනැගිල්ල, කොළඹ 07
පැමිණිලි සඳහා: 1960 / 071-0361010 අමතන්න.
සාමාන්‍ය සම්බන්ධ කර ගැනීම්: 011-5107722

### කාන්තා උපකාරක දුරකථන සේවාව

1938 ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් පැමිණිලි මධ්‍යස්ථානය, ජාතික කාන්තා කමිටුව

ක්ෂණික ඇමතුම් අංකය: 1938

නැතහොත් 011-2186063/011-2187038 හරහා අමතන්න.

ෆැක්ස්- 011-2187288

විද්‍යුත් තැපැල- secncwsl@gmail.com,

### නීති නිලධාරී, ජාතික කාන්තා කමිටුව,

5 වන මහල, 2 වන අදියර සෙත්සිරිපාය, බත්තරමුල්ල.

011-2186063/011-2187038 අමතන්න.

විද්‍යුත් තැපැල - secncwsl@gmail.com

## ශ්‍රී ලංකා නීතිඥ සංගමය

153, මිහිඳු මාවත, කොළඹ 12

දුරකථන: 011-2447134, 011-2331697

ෆැක්ස්: 011-2447134

විද්‍යුත් තැපැල - info@basl.com

## ශ්‍රී ලංකාවේ නීති ආධාර කොමිෂන් සභාව

අංක 129, අලුත්කඩේ වීදිය, කොළඹ - 12

දුරකථන: +94-11-2433618

# ආයතන

## EQUAL GROUND

දුරකථන: 011-2075121 / 011-4334279
ෆැක්ස්: 011-2075414
විද්‍යුත් තැපැල: equalground@gmail.com.



## Women in Need

දුරකථන: 011-4718585

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

දුරකථන: 011-4848856

BRIDGE to Equality - BRIDGE project which aims to improve the protection of human rights for LGBTQ people in Sri Lanka through the use of international human rights law to enable justice actors (judges, lawyers and other legal professionals), activists and human rights defenders to improve justice outcomes for the LGBTQ community; with a focus on overcoming challenges imposed by the current legal framework, as well as the overall promotion and protection of human rights of LGBTI people.

BRIDGE is jointly implemented by DAST, National Transgender Network and Young Out Here in partnership with the International Commission of Jurists since 2021.

---

BRIDGE to Equality යනු ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවන්ගේ මානව හිමිකම් සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ජාත්‍යන්තර මානව හිමිකම් සහ නීති පිලිබඳව විනිසුරුවරුන්, නීතිඥයින් සහ අනෙකුත් මානව හිමිකම් ක්‍රියාකාරීන් දැනුවත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ මානව හිමිකම් සුරක්ශිත කිරීම, ශ්‍රී ලංකාවේ වත්මන් නීතිමය රාමුව විසින් පනවන ලද අභියෝග ජය ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම, මානව හිමිකම් කඩ වූ ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින් හට යුක්තිය ලබා ගැනීමට ඔවුනට අවශ්‍ය සහය ලබාදීමද අරමුණු කරගනී.

BRIDGE to Equality ව්‍යාපෘතිය 2021 වසරේ සිට DAST, National Transgender Network සහ Young Out Here ආයතන විසින් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිෂන් සභාව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.

---

BRIDGE to Equality (சமத்துவத்தை தேடுதல்) என்பது சர்வதேச மனித உரிமைகள் சட்டத்தினூடாக இலங்கையில் உள்ள LGBTQ மக்களுக்கான மனித உரிமைகளின் பாதுகாப்பை மேம்படுத்துவதை நோக்கமாகக் கொண்ட ஒரு திட்டமாகும். LGBTQ சமூகத்திற்கான நீதி விளைவுகளை மேம்படுத்த நீதித்துறை வல்லுநர்கள் (நீதிபதிகள், வழக்கறிஞர்கள் மற்றும் பிற சட்ட வல்லுநர்கள்), ஆர்வலர்கள் மற்றும் மனித உரிமைகள் பாதுகாவலர்களை செயல்படுத்துவதனூடாக் தற்போதைய சட்டக் கட்டமைப்பால் சுமத்தப்படும் சவால்களை சமாளிப்பதுடன், LGBTQ மக்களின் மனித உரிமைகளின் ஒட்டுமொத்த மேம்பாடு மற்றும் பாதுகாப்பில் கவனம் செலுத்துகிறது.

BRIDGE to Equality (சமத்துவத்தை தேடுதல்) எனும் இந்த செயற்திட்டமானது DAST, தேசிய திருநர் வலையமைப்பு (NTN) மற்றும் யங் அவுட் ஹியர் (YOH) ஆகிய அமைப்புகளின் கூட்டாக 2021 முதல் பன்னாட்டு நீதித்துறை வல்லுநர்கள் ஆணையத்துடன் இணைந்து செயல்படுத்தப்படுகிறது.

BRIDGE to EQUALITY

සමානාත්මතාවය සොයා...
சமத்துவத்தை தேடுதல்...

bridge2equality.org
bridgetoequalitycampaign@protonmail.com
facebook.com/BridgetoEquality
twitter.com/B2ECampaign
instagram.com/bridgetoequality2021
youtube.com/@bridgetoequality